# සම්මුතිය හා පරමාර්ථය

පුටුවක් ඇතැයි යනුවෙන් අදහස් කරන්නේ සම්මුති අර්ථයකින් පුටුවක් යනුවෙන් හැඳින්වෙන්නක් ඇති බව ය. පරමාර්ථ වශයෙන් ගත් කල පුටුවක් නැතැයි යන්න මෙහි දී අපට අවශ්‍ය නම් කිව හැකි ය. පරමාර්ථ වශයෙන් පුටුවක් නැතැයි කීම හා සම්මුති වශයෙන් පුටුවක් ඇතැයි කීම යනු විරුද්ධාර්ථ නොවන බව ද පැහැදිලි විය යුතු ය. ඇත හා නැත යනු විරුද්ධාර්ථ වනුයේ එක්කෝ සම්මුති අර්ථයකින් ය. එසේත් නැතිනම් හැකියාවක් ඇත්නම් පරමාර්ථයකින් ය. එකක් සම්මුති අර්ථයකින් හා අනෙක පරමාර්ථයකින් ගෙන ඒ දෙකට එකිනෙකට විරුද්ධාර්ථ යැයි කිවහැකි නො වෙයි. පුටුවක් ඇතැයි යන්නෙහි එක් විරුද්ධාර්ථයක් ලෙස නොපුටුවක් ඇතැයි යනුවෙන් ගත හැකි වුව ද, ඉතා විශාල පිරිසකට රික්තයක නොපුටුවක් ඇතැයි යන්නෙන් පැහැදිලි කිසිවක් ගම්‍ය නො වෙයි.

විරුද්ධාර්ථ යන අප සිතන තරමට ම සරල දේ නො වෙයි. පියා යන වචනයෙහි විරුද්ධාර්ථය මව යැයි යමකුට කීමට හැකි ය. එහෙත් ඒ පියා යන්නෙහි විරුද්ධාර්ථය නොව විරුද්ධ ලිංගික පදය යැයි යමකුට තර්ක කළ හැකි ය. පියා යන්නෙහි විරුද්ධාර්ථ පදය පුතා යැයි යමකු කියනු ඇත. අප මේ සියල්ල සඳහන් කරන්නේ ආත්මය හා අනාත්මය යනුවෙන් කියැවෙන්නේ කුමක් දැයි තේරුම් ගැනීම සඳහා ය. ඊනියා පශ්චාත් නූතනවාදීන්ට අනුව පශ්චාත් ව්‍යුහවාදී සංකල්පයක් වන අනෙකා යන්න වැදගත් වෙයි. යමකු හෝ යමක් තේරුම් ගැනීමට එහි විරුද්ධය දැනගත යුතු ය යන්න මෙහි දළ අදහස වෙයි. එහෙත් ප්‍රශ්නය වනුයේ විරුද්ධය යනු කුමක් දැයි දැනගැනීම ය. අවශ්‍ය නම් එයට පිළිතුරක් ලෙස වචනයක සියලු විරුද්ධ අදහස් දැනගත යුතු යැයි ඔවුන් කීමට ඉඩ ඇත. එහෙත් ප්‍රශ්නය නම් අප වචනයක සියලු විරුද්ධාර්ථ දන්නේ ද යන්න ය.

වචනවල විරුද්ධාර්ථවලට දෙවැනි සියවසේ වැඩවිසූ නාගර්ජුන හිමිපාණෝ ද විශේෂ වැදගත්කමක් දුන්හ. උන්වහන්සේ සසරට විරුද්ධව නිවන ගත්හ. මෙය ආත්මයට විරුද්ධව අනාත්මය පෙරට ගැනීම වැනි වැඩකි. සසර යනු සම්මුති වශයෙන් ගත් සංකල්පයකි. සසර ගමන නතර කිරමට නිවන් අවබෝධ කරගැනීම යැයි ඇතැමකුට කිව හැකි වුව ද, ඒ දෙක අතර ඇත්තේ එතරම් ම සරල වෙනසක් නො වෙයි. සසර සංකල්පයක් වුව ද නිවන සංකල්පයක් නො වෙයි. නිවන සසරට සාපේක්ෂව ගත නො හැකි ය. සසර ගමන නැවැත්වීම නිවන ලෙස අප ගන්නේ අපට නිවන් අවබෝධ නොවන බැවින් ය. සසර දැනගත් පමණින් අපට නිවන් අවබෝධ කළ නො හැකි ය. අප ආත්මය යනුවෙන් දෙයක් සම්මුති වශයෙන් හෝ පරමාර්ථ වශයෙන් හෝ ගත් පමණින් අපට අනාත්ම අවබෝධ නො වෙයි. සසර නිවන, ආත්ම අනාත්ම ආදිය දුක සැප, අඳුර එළිය ආදී ලෙස ගත හැකි නො වෙයි. අඳුර එළිය ආදිය එකිනෙකට සාපේක්ෂ වෙයි. එහෙත් සසර නිවන එසේ නො වෙයි. ඒ එසේ වන්නේ නම් අඳුර දැනගත් විට එළිය දැනගන්නාක් මෙන් සසර දැනගත් විට නිවන ද දැනග යුතු වෙයි.

වචනයක අර්ථය තේරුම් ගැනීමේ දී එහි විරුද්ධාර්ථය උපකාර වන්නේ ඒ දෙක ම එක ම මට්ටමක පිහිටි විට ය. ඒ දෙක ම එක්කෝ සංකල්ප විය යුතු ය. නැත්නම් එලෙස ගැනීමට හැකි වෛදික ආදී සංස්කෘතීන්හි නම් ඒ දෙක ම එක්කෝ සම්මුති අර්ථයකින් විය යුතු ය. එසේත් නැතිනම් පරමාර්ථයකින් විය යුතු ය. ආත්ම අනාත්ම එවැනි එක ම මට්ටමක ඇති වචන නො වෙයි. සුදු හා සුදු නොවූ යන්න පැහැදිලි ය. එසේ පැහැදිලි වන්නේ සම්මුති අර්ථයකින් බව අවධාරණය කළ යුතු ය. කළු, නිල්, රතු ආදී ඕනෑ ම පාටක් සුදු නොවන ලෙස ගත හැකි ය. එහෙත් එහි දී සුදු නොවන යම් පැහැයකින් යුත් වස්තුවල පැවැත්ම අපි උපකල්පනය කරමු. සුදු නොවන පැහැයක් පැවතීම යනු කළු හෝ රතු හෝ වෙනත් පාටක් පැවැතීම ය. එහෙත් අපි කිසිවක් නැති තැනක සුදු නොවන පැහැයක් ඇතැයි නො කියමු. රික්තයක සුදු නොවන දෙයක් නැත.

පුටුවක් සම්බන්ධයෙන් ද අපි එවැන්නක් කීවෙමු. මේසයක් පවතින තැනක නොපුටුවක් හෝ පුටුවක් නොවන්නක් පවතින්නේ යැයි කිව හැකි වුව ද, අපි කිසිවක් නැති තැනක නොපුටුවක් හෝ පුටුවක් නොවන්නක් පවතින්නේ යැයි නො කියමු. ආත්මයක් පවතින්නේ යැයි වෛදිකයෝ කීහ. ඔවුන් ආත්මයක් පවතින බව කීවේ පරමාර්ථ වශයෙන් ය. ඒ ආත්මය භවයෙන් භවයට නොනැසී යන්නක් යැයි වෛදිකයෝ කීහ. බුදුන් වහන්සේට අවශ්‍ය වූයේ එවැනි

© Prof. Nalin De Silva

ආත්මයක් නැති බව දේශනා කිරමට ය. පරමාර්ථ වශයෙන් ගත් කල ආත්මයක් නැති බව උන්වහන්සේ දේශනා කළහ. එහෙත් එයින් කියැවෙන්නේ යමකුට සම්මුති වශයෙන් ආත්මයක් ඇතැයි කිව නොහැකි බව නො වෙයි.

මම යනුවෙන් කිසිවක් හෝ කිසිවකු පරමාර්ථ වශයෙන් ගත් කල නොමැත. එහෙත් අපි මම යනුවෙන් යමකු ඇතැයි සම්මුති වශයෙන් ගනිමු. එහි කිසිදු ගැටලුවක් නැත. පරමාර්ථ වශයෙන් මම යැයි කිසිවකු නැතැයි පැවසීමට සම්මුති වශයෙන් මම යනුවෙන් යමකු ඇතැයි ගැනීම බාධාවකක් නො වෙයි. ආත්ම යන්න ද එසේ ය. පරමාර්ථ වශයෙන් ආත්මයක් නැත. ඇතැම් උගත් බෞද්ධයන්ට ප්‍රශ්නයක් වී ඇත්තේ පරමාර්ථ වශයෙන් හෝ ආත්මයක් නැතැයි කීමේ දී පරමාර්ථ වශයෙන් ආත්මයක් ඇතැයි යනුවෙන් කියැවෙන්නේ ද යන්න ය. නැතැයි කීමේ දී ඇතැයි යන්න ද උපකල්පනය කෙරෙන බව ඔවුහු කියති. නැතිවිය හැක්කේ ඇති දෙයක් ය යන්න ඔවුන්ගේ අදහස ය. මෙතැන පුටුවක් නැතැයි යමකුට කිව හැක්කේ එක්කෝ එතැන පුටුවක් ඇති බැවින් ය.

මෙතැන පුටුවක් නැතැයි කීමේ දී එවැන්නක් ගම්‍යවන බව සැබෑ ය. එහෙත් අප මෙතැන පුටුවක් නැතැයි කියන්නේ සම්මුති වශයෙන් ය. සම්මුති වශයෙන් පටුවක් නැතැයි කීමේ දී කොතැනක හෝ පුටුවක් තිබූ බව හෝ කොතැනක හෝ පුටුවක් ඇති බව හෝ ඒ දෙක ම හෝ උපකල්පනය කෙරෙයි. එහෙත් පරමාර්ථ වශයෙන් පුටුවක් නැතැයි කිවහොත් එයින් අදහස් කෙරෙන්නේ කුමක් ද? පරමාර්ථ වශයෙන් කිසිවක් නැතැයි කීමට පරමාර්ථ වශයෙන් කිසිවක් ඇතැයි ගත යුතු නො වෙයි. පරමාර්ථ වශයෙන් ගත් කල පුටුවක් නැතැයි කීමට පරමාර්ථ වශයෙන් පුටුවක් ඇති බවක් උපකල්පනය කළ යුතු නො වෙයි. මෙහි දී නැතැයි කියන්නේ පරම අර්ථයකින් ය. පරමාර්ථ වශයෙන් පුටුවක් නැතැයි කියන විට මෙතැන හෝ එතැන හෝ මේ මොහොතේ හෝ වෙනත් මොහොතක හෝ ආදිය අදාළ නො වෙයි.

සම්මුති වශයෙන් පුටුවක් නැතැයි යනුවෙන් සාමාන්‍යයෙන් කියැවෙන්නේ මෙතැන මේ මොහොතෙහි පුටුවක් නැති බව ය. කිසි දා කිසි තැනක පුටුවක් නො තිබූ බවක් ඉන් නොකියැවෙයි. එහෙත් පරමාර්ථ වශයෙන් පුටුවක් නැතැයි කියන විට ඉන් අදහස් වන්නේ කිසි දා කිසි තැනක පුටුවක් නොතිබූ බව පමණක් නො ව කිසිදා කිසි තැනක ආදී සංකල්ප ද සම්මුති වශයෙන් පමණක් ඇති සංකල්පය බව ය. පරමාර්ථ වශයෙන් ගත් කල ඒ කිසිවක් නැත. පරමාර්ථ වශයෙන් කිසිවක් නැතැයි කීමට පරමාර්ථ වශයෙන් කිසිවක් ඇති බවක් උපකල්පනය කළ යුතු නො වෙයි. එබැවින් ඇතැම් උගත් බෞද්ධයන් පරමාර්ථ වශයෙන් යමක් ඇත්තේ ද නැත, නැත්තේ ද නැත යනුවෙන් කියන විට එයින් කිසිවක් නො කියැවෙයි.

ආත්මයක් ඇත්තේ ද නැත, නැත්තේ ද නැත යනුවෙන් කීම අවශ්‍ය නො වෙයි. පරමාර්ථ වශයෙන් ආත්මයක් නැතැයි කීමට පරමාර්ථ වශයෙන් ආත්මයක් ඇතැයි ගත යුතු නො වෙයි. එසේත් නැතහොත් අනාත්මයක් ඇතැයි ගත යුතු ද නො වෙයි. සම්මුති වශයෙන් ඇතැම් අවස්ථාවල එසේ ගත යුතු ය. නැත්නම් එසේ ගත හැකි ය. මෙතැන පුටුවක් නැතැයි කී විට ඇතැම් විට මෙතැන මේසයක් අතැයි කිව හැකි ය. ඒ එතැන මේසයක් ඇති විට ය. එවිට එතැන අවශ්‍ය නම් නොපුටුවක් ඇතැයි ද කිව හැකි ය. ඒ මේසය නොපුටුව ලෙස ගැනීමෙන් ය. එහෙත් ආත්මයක් නැතැයි කියන විට එවැනි ඇති කතාවක් පැන නො ගනියි. පුටුවක් නැත්නම් ඇත්තේ කුමක් ද වැනි ප්‍රශ්නයක් ආත්මයක් නැතැයි කීවිට පැන නො නගියි. අපි ආත්මයක් නැත්නම් ඇත්තේ කුමක් ද යන ප්‍රශ්නය නො අසමු. එයට හේතුව ඒ ප්‍රශ්න ඇසෙන්නේ විවිධ මට්ටම්වල, විවිධ තලවල වීම ය. පරමාර්ථ වශයෙන් ගත් කල කිසිවක් නැති බැවින් ආත්මයක් නැත්නම් ඇත්තේ කුමක් ද යන ප්‍රශ්නය පැන නො නගියි.

අවශ්‍ය නම් මෙය තවදුරටත් පැහැදිලි කළ හැකි වෙයි. පරමාර්ථ වශයෙන් ගත් කල කිසිවක් නැතැයි යනුවෙන් කීමේ දී කිසිවක් යන්න යොදා ගැනෙන්නේ සම්මුති අර්ථයකින් ය. වෙනත් වචනවලින් කියන්නේ නම් පරමාර්ථ වශයෙන් කිසිවක් නැතැයි කීමේ දී කිසිවක් යන්නෙන් පරමාර්ථ වශයෙන් ගත් කිසිවක් අදහස් නො වෙයි. ඇතැම්විට එසේ කීම තරමක් පැටලිලි සහගත විය හැකි ය. එහෙත් ඒ පටලැවිල්ල නැතිකර ගත යුතු ය. අප කිසිවක් පවතී යැයි කියන්නේ සම්මුති අර්ථයකින් මිස පරමාර්ථයකින් නොවන බව පැහැදිලි විය යුතු ය. අප කිසිවක් නැතැයි කීමේ දී කිසිවක් යනුවෙන් ගන්නේ ද සම්මුති අර්ථයකින් ය. එහි පරමාර්ථයක් නැත. තිබිය නො හැකි ය. කිසිවක් යන වචනයට තේරුමක් ලැබෙන්නේ සම්මුති අර්ථයකින් මිස පරමාර්ථයකින් නො වෙයි.

© Prof. Nalin De Silva

පරමාර්ථ වශයෙන් ආත්මයක් නැත යනුවෙන් කීමෙහි දී ආත්මය යන වචනය යොදා ගැනෙන්නේ සම්මුති අර්ථයකින් ය. ආත්මය යන්න පරමාර්ථයකින් ගත හැකි නො වෙයි. ඇතැම් උගත් බෞද්ධයන් මෙහි දී ආත්මය යන්න පරමාර්ථ වශයෙන් ගෙන ආත්මයක් නැතැයි යනුවෙන් කිව නොහැකි යැයි කියන්නේ දැයි නොදනිමි. ඔවුන් එසේ පරමාර්ථය හා සම්මුතිය විශ්ලේෂණය කර ඇති බවක් නම් කිව නො හැකි ය. ඔවුන් ආත්මයක් ඇත්තේ ද නැත, නැත්තේ ද නැත ආදී වශයෙන් කියන්නේ නම් එවැනි විශ්ලේෂණයකින් පසුව නො වෙයි. ඇතැම් උගත් බෞද්ධයන් එසේ වුව ද දෙවැනි සියවසේ ජීවත් වූ නාගර්ජුනපාදයන් වහන්සේ ගැන නම් එසේ කිව නොහැකි ය.

නාගර්ජුනපාදයන් වහන්සේ ආන්ද්‍ර ප්‍රදේශයෙහි වැඩ විසූ භිකෂුන්වහන්සේ නමක යැයි සඳහන් වෙයි. ඉතා පැහැදිලිව ම බෞද්ධ සංස්කෘතියෙහි සඳහන්වන ප්‍රධාන ම දාර්ශනිකයා උන්වහන්සේ ය. බ්‍රාහ්මණ පවුලක උපත ලැබීමෙන් වෛදික සම්ප්‍රදායෙහි ඇති වියුක්තව සිතීම උන්වහන්සේට කුඩා කල ම ලැබෙන්නට ඇත. අද මාධ්‍යමිකවාදය නමින් හැඳින්වෙන දර්ශනයෙහි නිර්මාතෘවරයා උන්වහන්සේ ය. මාධ්‍යමිකවාදය අවසාන වශයෙන් ගත් කල පැවැත්ම හා සම්බන්ධ වෙයි. පරමාර්ථ වශයෙන් ගත් කල කිසිවක් නැත යනු උන්වහන්සේගේ ඉගැන්වීම විය. ඇතැමුන් උන්වහන්සේ මහායාන භිකෂුන්වහන්සේ කෙනකු ලෙස නොසැලකුව ද මහායාන දර්ශනයෙහි නිර්මාතෘවරයා උන්වහන්සේ ය. උන්වහන්සේ ථෙරවාදයෙහි එන එක් ප්‍රධාන ඉගැන්වීමකට විරුද්ධ විය. ඒ ස්වභාවය පිළිබඳව ය. ථෙරවාදී භිකෂුන්වහන්සේ ස්වභාවයක් ඇති ධර්ම ඇතැයි සැලකූහ. යම් ධර්මයකට ස්වභාවයක් ඇතැයි යනුවෙන් සැලකීම ඒ ධර්මයට පරමාර්ථයක්, ධර්මාත්මයක් ආරෝපණය කිරමක් විය. පුද්ගලාත්මයට පමණක් නොව ධර්මාත්මයට ද නාගර්ජුනපාදයන් වහන්සේ විරුද්ධ වූහ.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva